පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - චිත්‍ර

ශ්‍රේණිය - 8

සතිය- 3

Prepared by- එච්.ටී.ඞී.ජයවර්ධන

කලාප අධ්‍යාපන කාර්යාලය - ඇඹිලිපිටිය

**2 වන වාරය - 2 වන පාඩම**

**7.2.1. හින්දු පිළිමවල ආසන , ආසන ක්‍රම හා මුද්‍රා අධ්‍යයනය කරයි.**

**මුද්‍රා**

මුද්‍රා -

- ප්‍රතිමාවේ දෑත් නිරූපණය කර ඇති ආකාරය මුද්‍රාව ලෙස හැඳින්වේ.
- දෑත් හසුරුවා ඇති ආකාරය අනුව මුද්‍රා වර්ග නම් කෙරේ. ඒවා සංකේතාත්මක වන අතර විවිධ අර්ථ කථන දක්වා ඇත.
- බොහෝ විට ප්‍රතිමාවක භාව ප්‍රකාශනය හා සමස්ත ගුණය සංකේතාත්මක වශයෙන් නිරූපණය කෙරෙනුයේ මුද්‍රාව මඟිනි. හින්දු ප්‍රතිමාවල බහුල වශයෙන් දැකිය හැකි එවැනි මුද්‍රා කිහිපයකි.

i.අභය මුද්‍රාව -
නිදහස හා ආරක්ෂාව ලබා දීම මෙම මුද්‍රාවෙන් සංකේතවත් කරයි. වැළමිටෙන් අත නමා ඉදිරියට දක්වා ඇත.

ii.ගජ හස්ත මුද්‍රාව -
අලි හොඬවැලක ස්වරූපයෙන් අත්ල සහ ඇඟිලි පහළට දිගු කර නිරූපණය කෙරේ. බාධක ඉවත් වී නිදහස ලැබීම සංකේතවත් කෙරේ.

iii.නමස්කාර මුද්‍රාව/ අංජලි මුද්‍රාව -
ආයාචනය, ප්‍රාර්ථනය හා වැඳීම යන අදහස් මෙම මුද්‍රාවෙන් නිරූපණය කරයි. දෑත වැළමිටෙන් නමා පපුව ඉදිරියෙන් අත්ල හා ඇඟිලි එකට එකතු කිරීමෙන් මෙම මුද්‍රාව දක්වේ.

iv.වරද මුද්‍රාව -
වරයක් දීම මින් සංකේතවත් කරයි. එසේ ම, පහතට දැමූ අතේ ඉදිරිපසට හැරුණු අත්ල හා ඇඟිලි සහිත ව මෙම මුද්‍රාව නිරූපණය කර පෙන්වයි.

v.විතර්ක මුද්‍රාව -
අත්ල ඉදිරිපසට හැරී ඇති අතර, මාපට ඇඟිල්ල මත දබරැඟිල්ල තබා දක්වා ඇත. ගැටලුවක් විසඳන අවස්ථාවක් මුද්‍රාවෙන් අර්ථවත් කර පෙන්වයි.

vi.කටක හස්ත මුද්‍රාව -
යමක් අල්වා සිටින ආකාරයට ඇඟිලි නිරූපණය කරයි. මෙම මුද්‍රාව බොහෝ විට ත්‍රිභංග ලක්ෂණ සහිත දේවරූපවල හා ස්ත්‍රෝකරුවන්ගේ රූපවල සුලභව දැකිය හැකි වේ.

vii.ලෝල හස්ත මුද්‍රාව -
කාන්තා දේවරූප සඳහා බහුලව භාවිත කෙරේ. පහළට වැටුනු අතෙහි අත්ල සහ ඇඟිලි රිද්මයානුකූලව පොළොවට දිගුවන ලෙස නිරූපණය කර පෙන්වයි. මින් තැන්පත් බව සංකේතවත් කර දක්වයි.


අභය මුද්‍රාව




ගජහස්ත මුද්‍රාව



නමස්කාර මුද්‍රාව



වරද මුද්‍රාව



විතර්ක මුද්‍රාව



කටක හස්ත මුද්‍රාව



ලෝල හස්ත මුද්‍රාව